විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය　　தலைமுறையொன்றின் பெருமிதம்　　Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/10-2025　　ඔබේ අංකය / உமது இல. / Your No. } ..............　　දිනය / திகதி / Date } 2025.05. 29

විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 01/2025

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2025 අයවැය යෝජනා අනුව විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් ගැලපීම</u>**

2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත වැටුප් සංශෝධනය අනුව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික, මරණ පාරිතෝෂික සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී අදාළ කර ගත යුතු විධිවිධාන ඇතුළත් කරමින් 2025.05.29 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2025 නිකුත් කර ඇත.

02. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2025 හි සඳහන් විධිවිධාන අනුව ගෙවීම් සිදු කිරීමට හැකිවන පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය (Pensions Management System) නවීකරණය කරනු ලබන අතර, එතෙක් ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව ප්‍රතිලාභ හිමිගැන්වීම සඳහා පහත පරිදි කටයුතු කළ යුතු ය.

2.1. 2025.01.01 දින ද සේවයේ යෙදී සිට 2025.03.31 දින තෙක් කාලසීමාව තුළ

2.1.1. සේවයෙන් විශ්‍රාම ගිය නිලධරයන් වෙත විශ්‍රාම වැටුප සහ පාරිතෝෂික හිමිගැන්වීම.

i. නිලධරයා විශ්‍රාම ගෙන ඇති අවස්ථාවේ ගෙවන ලද වැටුප මත පදනම්ව PD 03 අයදුම්පත්‍ර සකස් කර ඉදිරිපත් කිරීම මුලින්ම සිදු කළ යුතු ය.

ii. ඒ අනුව නිලධරයා වෙත මාසික විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හිමිගැන්වීම සිදු කරන අතර, 2025.06.30 දින තෙක් එම විශ්‍රාම වැටුප ගෙවීම සිදු කළ යුතු ය. මෙම හිමිගැන්වීමට අදාළව සාමාන්‍ය පරිදි විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

iii. මෙම නිලධරයන්ගේ විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව සංශෝධනය කිරීම සඳහා විශ්‍රාම වැටුප්



මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

කළමනාකරණ දත්ත පද්ධතිය මගින් 2025.06.15 දින සිට හඳුන්වාදෙන අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) ඔස්සේ නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනය විසින් අයදුම් කිරීම සිදු කළ යුතු ය.

iv. එහි දී 2025 අයවැය යෝජනාවල ඇතුළත් නව වැටුප් පරිමාණ අනුව නිලධරයාගේ වැටුප සකස් කිරීමෙන් පසුව නිලධරයාට හිමිවන සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය වෙත තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. වැටුප් පරිවර්තන ලිපියේ පිටපතක් ද විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය වෙත උඩුගත කළ යුතු ය. ඒ අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කරනු ලබන අතර, ඊට අදාළව නිකුත් කරන සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය ආයතන ප්‍රධානියා විසින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් ලබාගෙන සහතික කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යැවිය යුතු ය.

v. මෙම නිලධරයන් වෙත හිමිගන්වන විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය 2025 අයවැය යෝජනා අනුව වැටුප් සංශෝධනයට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

2.1.2. සේවයේ යෙදී සිටිය දී මියගිය නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමිගැන්වීම.

i. නිලධරයා මියගිය දිනට ගෙවමින් තිබූ වැටුප මත පදනම්ව මරණ පාරිතෝෂික අයදුම්පත්‍ර (PD 05) ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. ඒ අනුව ගණනය කිරීම් කර මරණ පාරිතෝෂිකය හිමිගැන්වීම සිදු කෙරේ.

ii. ඉහත පරිදි හිමිගන්වන මරණ පාරිතෝෂිකය 2025 අයවැය යෝජනා අනුව වැටුප් සංශෝධනයට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

2.1.3. සේවයේ යෙදී සිටිය දී මියගිය සහ විශ්‍රාම ලබා විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියගිය නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

i. මෙම කාලසීමාව තුළ සේවයේ යෙදී සිටිය දී මියගොස් ඇති නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා ඉහත 2.1.2 (i) හි PD 05 අයදුම්පත ද සමග යාවත්කාලීන කරන ලද චර්යා සටහන ඇතුළු අනෙකුත් අදාළ ලියකියවිලි සහිතව PD04 අයදුම්පත්‍ර

සකස් කර ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව නිලධරයා මියගිය දිනට ගෙවමින් තිබූ වැටුප සහ සේවා කාලය මත පදනම්ව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කර හිමිගැන්වීම සිදු කෙරේ. ඊට අදාළව සාමාන්‍ය පරිදි වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ. 2025.06.30 දින දක්වා ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම සිදු කළ යුතු ය.

ii. මෙම කාලසීමාව තුළ සේවයෙන් විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව 2025.06.30 දින තෙක් කාලසීමාව තුළ මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා ඉහත අනෙකුත් අදාළ ලියකියවිලි සහිතව PD04 අයදුම්පත්‍ර සකස් කර ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කර ගත් වැටුප මත පදනම්ව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කර හිමිගැන්වීම සිදු කෙරේ. ඊට අදාළව සාමාන්‍ය පරිදි වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ. 2025.06.30 දින දක්වා ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම සිදු කළ යුතු ය.

iii. ඉහත 2.1.3. (i) සහ (ii) හි පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට නව වැටුප් පරිමාණ අනුව සංශෝධන කළ යුතු ය. ඒ සඳහා පහත පරිදි කටයුතු කළ යුතු ය.

(අ) මියගිය නිලධරයාගේ විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය කිරීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් 2025.06.15 දින සිට හඳුන්වාදෙන අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) ඔස්සේ නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනය විසින් අයදුම් කිරීම සිදු කළ යුතු ය.

(ආ) එහි දී 2025 අයවැය යෝජනාවල ඇතුළත් නව වැටුප් පරිමාණ අනුව නිලධරයාගේ වැටුප සකස් කිරීමෙන් පසුව නිලධරයාට හිමිවන සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය වෙත තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. වැටුප් පරිවර්තන ලිපියේ පිටපතක් ද විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය වෙත උඩුගත කළ යුතු ය. ඒ අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කරනු ලබන

අතර ඊට අදාළව සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(ඇ) ඉහත පරිදි නිකුත් කරන සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිලධරයා අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන ප්‍රධානියා විසින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් ලබාගෙන සහතික කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යැවිය යුතු ය. ඒ අනුව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කළ යුතු ය.

2.2. 2025.04.01 දින ද සේවයේ යෙදී සිට ඉන් පසුව

2.2.1. සේවයෙන් විශ්‍රාම ගිය නිලධරයන් වෙත විශ්‍රාම වැටුප සහ පාරිතෝෂික හිමිගැන්වීම.

i. මෙම නිලධරයන් වෙත විශ්‍රාම වැටුප හිමිගැන්වීම අදියර දෙකක් යටතේ සිදු කරනු ලැබේ. නිලධරයා විශ්‍රාම ගන්වන අවස්ථාවේ නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව PD 03 අයදුම්පත්‍ර සකස් කර ඉදිරිපත් කිරීම මුලින්ම සිදු කළ යුතු ය. ඒ අනුව නිලධරයා වෙත මාසික විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හිමිගැන්වීම පළමු අදියරේ දී සිදුකරනු ලබන අතර මෙම හිමිගැන්වීමට අදාළව සාමාන්‍ය පරිදි විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

ii. මෙම නිලධරයන්ගේ විශ්‍රාම වැටුප නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව සංශෝධනය කිරීම දෙවන අදියරේ දී සිදු කරන අතර ඒ සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් 2025.06.15 දින සිට හඳුන්වාදෙන අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) ඔස්සේ නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනය විසින් තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. ඒ අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කරනු ලබන අතර ඊට අදාළව සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ. ඉහත පරිදි නිකුත් කරන සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිලධරයා අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන ප්‍රධානියා විසින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් ලබාගෙන සහතික කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යැවිය යුතු ය.

iii. මෙම නිලධරයන් වෙත හිමිගන්වන විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

2.2.2. සේවයේ යෙදී සිටියදී මියගිය නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමිගැන්වීම.

i. නිලධරයා මියගිය දිනට නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව මරණ පාරිතෝෂික අයදුම්පත්‍ර (PD 05) ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. ඒ අනුව ගණනය කිරීම් කර මරණ පාරිතෝෂිකය හිමිගැන්වීම සිදු කෙරේ.

ii. මෙම නිලධරයන් වෙත හිමිගන්වන මරණ පාරිතෝෂිකය නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

2.2.3. සේවයේ යෙදී සිටිය දී මියගිය සහ විශ්‍රාම ලබා විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියගිය නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

i. මෙම කාලසීමාව තුළ සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා ඉහත 2.2.2 (i) හි PD 05 අයදුම්පත ද සමග යාවත්කාලීන කරන ලද වර්යා සටහන ඇතුළු අනෙකුත් අදාළ ලියකියවිලි සහිතව PD04 අයදුම්පත්‍ර සකස් කර ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව නව වැටුප් පරිමාණ අනුව නිලධරයාට හිමි සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කර හිමිගැන්වීම සිදු කෙරේ. ඊට අදාළව සාමාන්‍ය පරිදි වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

ii. මෙම කාලසීමාව තුළ සේවයෙන් විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා අනෙකුත් අදාළ ලියකියවිලි සහිතව PD04 අයදුම්පත්‍ර සකස් කර ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව නිලධරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කර ගත් වැටුප මත පදනම්ව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කර හිමිගැන්වීම සිදු කෙරේ. ඊට අදාළව සාමාන්‍ය පරිදි වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

iii. ඉහත 2.2.3. (ii) හි පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව සංශෝධනය කිරීම සඳහා පහත පරිදි කටයුතු කළ යුතු ය.

(අ) මියගිය නිලධරයාගේ විශ්‍රාම වැටුප 2027.01.01 දිනට නිලධරයාට හිමිවිය යුතු සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව සංශෝධනය කිරීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් 2025.06.15 දින සිට හඳුන්වාදෙන අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) ඔස්සේ නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනය විසින් තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. ඒ අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කරනු ලබන අතර ඊට අදාළව සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(ආ) ඉහත පරිදි නිකුත් කරන සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිලධරයා අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන ප්‍රධානියා විසින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් ලබාගෙන සහතික කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යැවිය යුතු ය.ඒ අනුව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කළ යුතු ය.

03. විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් හඳුන්වාදීමට නියමිත අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) අනුව කටයුතු කිරීමට අදාළ පරිශීලක අත්පොත (User Manual) 2025.06.15 දින වන විට නිකුත් කරනු ලැබේ.

04. මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී එහි විධිවිධාන සම්බන්ධයෙන් පැහැදිලි කරගැනීම් හෝ වැඩිදුර උපදෙස් අවශ්‍යවන අවස්ථාවල දී සහ පැනනගින තාක්ෂණික ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා පහත සඳහන් දුරකථන අංක වෙත සම්බන්ධ විය හැකි ය.

| අනු අංකය | තනතුර | දුරකථන අංකය |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා විමර්ශන) | 011 2 421786 |
| 02. | අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) | 011 2 320045 |
| 03. | අධ්‍යක්ෂ (ඩිජිටල් පරිපාලන සහ සේවා) | 011 2 431729 |
| 04. | අධ්‍යක්ෂ (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්) | 011 2 336913 |
| 05. | ගණකාධිකාරි (මාසික ගෙවීම්) | 011 2 331 791 |
| 06. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත) | 011 2 322278 |
| 07. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මධ්‍යගත) | 011 2 434414 |

| | | |
|---|---|---|
| 08. | සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්) සහ (සන්නද්ධ සේවා-වැ.බ.) | 011 2 327752 |

Achami

වාමින්ද හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786
ෆැක්ස් : 011 2 431413
විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com

**පිටපත් :**

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.
9) පාර්ලිමේන්තු මහ ලේකම් - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස.